උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ 11

# දෙයක් වෙන්නෙ ඒක වෙන්න තියෙන හොඳම විදියට

"බලපං ,උඹ මහලොකු චිත්‍රපටිකාරයෙක්ලු,ඒත් උඹේ ප්‍රකාශන ශක්තිය බිංදුවයිනෙ.පපුව ඉස-සරහට දාගෙන ගිහිං ඒ කෙල්ලගෙන් හරි ඒ කෙල්ලගෙ ගෙදරින් හරි අහන්න තරං ශක්තියක් උඹට තිබුණද? නෑ .දැන් ඒ කෙල්ල අපා දුක් විඳිනවා.උඹ කනමදයා වගේ බොනවා.කොහෙද හැමදාම හවසට උඹේ චිත්‍රපටිකාරයො එක්ක වලබහින්න යනවා මිසක් උඹට කොහෙද ලව් කරන්න වෙලාවක් තිබුණෙ."

ආර්තී කඳුළු පුරෝගෙන සෝපාවෙ වාඩිවෙලා හිටියා. "පොඩි අයියට දොස් කියන්න එපා නිල්හාන්. එයාගෙ හැටි එහෙම තමා. මේක මේ දෙන්නගෙම ලැබීම."

ආර්තී කලාතුරකින් මට පොඩි අයියා කියනවා.නැත්තං නම කියනවා.උණු කෝපි එකක් හදලා මට දීලා ආර්තී මං ලඟ වාඩිවෙලා මගේ පිට අතගෑවා.

"දෙයක් වෙන්නෙ ඒක වෙන්න තියෙන හොඳම විදියට. එහෙම නේද? මං හිතන්නෙ නෑ චත්‍රා තව කාලයක් නිහඬව ඉඳීවි කියලා.ගෑණි කවදහරි ඕක දුලිනිට කියනවා.එදාට දුලිනි තීරණයක් ගනියි.ඔන්න එතකොට ඔයා කෙලින් ඉන්න ඕනෙ.හරිද?"

ඒත් දුලිනි මහ ගෙදර ගියත් එක්කම මං අයදුම් කරපු ශිෂ්‍යත්වය ලැබිලා මට ඇමෙරිකාවෙ නිව්යෝර්ක් නගරයට යන්න වුණා.ඒ ජීවිතේ සහමුලින්ම වෙනස්.මං අවුරුදු දෙකක් එහේ හිටියා.ඒ අතරෙ තමා මට "ඉසබෙලා" හම්බ-වුණේ.ඇමෙරිකාවෙ ජීවිතේ හරිම වේගවත්. "කාලය යනු මුදල් ය" කියන මතයෙ තමා බහුතරය හිටියෙ.පූර්ණ ශිෂ්‍යත්වයක් ලබපු නිසා ඉන්න හිටින්න තැන් පවා ලැබුණා.අපේ කණ්ඩා-යමේ හිටියෙ ඔක්කොම පහළොස් දෙනයි.ඇ-මෙරිකානු ඉංග්‍රීසි උච්ඡාරණය මං හිතපු තරං අසීරුතාවයකට මාව පත්කළේ නැහැ.මොකද බොරැල්ලෙ අපේ සිනමා කල්ලිය එක්ක ඉඳිද්දි පමණටත් වඩා හොලිවුඩ් චිත්‍රපටි නරඹපු නිසා.

මං බලාපොරොත්තු වුණේ ආරම්භයේදී දේශණ මාලාවක් එක්ක ඒකාකාරී වෙන්න වෙයි කියලා. ඒත් පලවෙනි දවසෙ ඉඳන් තිබුණෙ නිර්මාණ කරනයේ යෙදෙන්න.අපි තනියම ඉගෙන ගත්ත මිසක් කවුරුවත් ඉගැන්නුවෙ නැහැ.ඉගෙන ගන්න අවශ්‍ය දේවල් සැපයීම සහ ගැටළුකාරී තැන් නිරවුල් කරගැනීමට අත්වැලක් දීම තමා මූලිකව සිද්ධවුණේ.පසුකලෙක ලංකා-වෙදි මං ඒ ඉගෙනුම්ක්‍රම ක්‍රියාත්මක කරන්නත් පෙළඹුණා. "උඹේ ඇමෙරිකන් ස්ටයිල් එකට කොල්ලො කෙල්ලො වහ වැටිලා නේද?" ඒ කාලෙ නිල්හාන් මට විහිළු කළා.





උපේක්ෂා සේනානායක
ලියයි



අතුල උපසිරි කල්දෙමුල්ල ගේ
සිතුවමින්

මුලින්ම අපේ කණ්ඩායමේ හිටිය අයට මාව ජීරණය වුණේ නැහැ.මට ත් අනික් අය සම්බන්ධයෙන් තිබුණෙ ඒ හැඟීම ම තමා.කමිසෙ යට කරලා ඇඳලා කොණ්ඩෙ පිළිවෙලට පීරලා හිටපු නිසා මාව බොහොම සීරියස් කෙනෙක් විදියට තමා අනිත් අයට පෙනිලා තිබුණෙ. පස්සෙ මං හඩු ඩෙනිම් ඇඳලා මැදපු නැති ටී ෂර්ට් ඇඳලා ගියාම තමා ඒ අය මාත් එක්ක සමීප වුණේ.බ්‍රසීල ජාතික ඉසබෙලා කණ්ඩායමේ හිටිය ලාබාලම සාමාජිකාව වගේම ඇය ඉතාම මිත්‍රශීලී තරුණියක් වුණා.ඉසබෙලාට එතකොට වයස අවුරුදු විසි එකයි. මට විසි අටටත් කිට්ටුයි එතකොට.අපි තුන්දෙනා බැගින් වන කුඩා කණ්ඩායම් වලට කැඩුවම මං වැටුණෙ ඉසබෙලායි මාඩියි එක්ක. මාඩි කදිම පෙනුමක් තිබුණු නයිජීරියානු ජාතික තරුණයෙක්. බැලූ බැල්මට ක්‍රයි ෆ්‍රීඩම්(හඬනු මැන නිදහස) චිත්‍රපටියෙ ස්ටීව් බිකෝගෙ චරිතයට පණ පොවපු ඩෙන්සෙල් වොෂින්ග්ටන් වගේ.පෙනුමෙන් වගේම ගතිගුණ වලිනුත් මාඩි නියම මහත්මයෙක්.අදටත් ඔහු මගේ හොඳම මිතුරෙක්. ආදරණීය මාඩියි ඉසියි මමයි එකතුවෙලා අපේ පලවෙනි සාමූහික කෙටිචිත්‍රපටිය කරපු යුගය මගේ මතකයේ සිනමාපටියක් වගේ මගේ මතකයේ තියෙනවා. අපි තුන්දෙනා එකතුවෙලා මුලින්ම කළේ තිර රචනය සකස්කරපු එක. මාඩිට තිබුණ විශිෂ්ඨ භාෂා ඥානයක්.ඉසීට වේගයෙන් පරිගණක යතුරුපුවරුව හසුරු-වන්න පුළුවන්. කථා සංකල්පය මගේ.

කථාවෙ සාරාංශය කිව්වොත් මෙහෙමයි.

තෙල් සායම් චිත්‍ර කලාව ප්‍රගුණ කරපු ප්‍රංශ චිත්‍ර ශිල්පිණියක් ලංකාවට යනවා විහාර බිතුසිතුවම් ගැන අධ්‍යයනය කරන්න. එහෙදි ඇය තරුණ හිමි නමක් සමඟ මිත්‍ර වෙනවා. නමුත් එය ඒක පාර්ශවික අප්‍රකාශිත ප්‍රේමයක්. හිමිනම පසුව උපැවිදි වෙලා ප්‍රංශයට එනවා ඔහුගෙ මිතුරිය දකින්න. විශාල පරිශ්‍රමයක් දරලා ඇය ඉන්න තැන සොයාගන්නකොට දරුණු පිළිකා රෝගයක් වැලඳිලා ඇය මිය ගිහින්. නමුත් ඇය නිමා නොකළ අනර්ඝ සිතුවම් රැසක් ඔහුට හමුවෙනවා ඇගේ පියාට අයත් ගොවිපළේ ඇය භාවිතා කළ කුඩා කාමරයෙ තිබිලා. ඔහු මහත් වෙහෙසක් දරලා ඒ සිතුවම් සියල්ල සම්පූර්ණ කරළා නැවත ලංකාවට ගිහින් පැවිදි වෙනවා.

කථාවෙ සාරාංශය ඒක වුණාට ඒ කථාව විසල් කම්පනයක් දනවන සුළු වීතරාගී කථා වස්තුවක් කියලා අපේ මහාචාර්යයතුමා අගය කළා. නිව්යෝක් විහාරයේත් අපේ මහාචාර්ය රඩ්ගෙ ගොවිපලෙත් තමා රූපගත කිරීම් කළේ. චිත්‍රපටියෙ ධාවන කාළය මිනිත්තු හතළිස් පහයි. චරිත තුනයි තිබුණෙ. මම හිමිනමගෙ චරිතය නිරූපණය කළා.

ඉසී චිත්‍ර ශිල්පිණියගෙ චරිතය විශිෂ්ඨ ලෙස රඟපෑවා. මාඩි චිත්‍රශිල්පිණියගෙ පියාගෙ චරිතය කළා. කිසිම චරිතයකට අපි නමක් දුන්නෙ නැහැ හිතාමතාම. කැමරාකරණය මාඩිගෙ. කථාව දෙබස් සංගීතය සහ පසුතල නිර්මාණය මගේ. සංස්කරණය කළේ ඉසී.ඇය ඉතාම දක්ෂ ලෙස සංස්කරණය කිරීමේ ප්‍රතිඵලය වුණේ අපේ චිත්‍රපටිය අපේක්ෂිත සංක්ෂිප්තභාවය සපුරාලීම.ඇය රූප රාමු මෙන්ම හඬපටි සංස්කරනයේදී දැක්වූ බුහුටිකම ඉසී කෙරෙහි මා ආකර්ෂණය වීමට බලපෑ ප්‍රධාන සාධකය යැයි මට හිතෙනවා.මහාචාර්ය රඩ් ඉතාම පැහැදුණා අපේ සාමූහික ප්‍රයත්නය ගැන.

පැවරුම අවසන් වන විට ඉසී මගේ කාමරයේ පදිංචියට ඇවිත් හිටියා.ඇය ඉතා තදින් ප්‍රිය කළා කෝපි පානය කිරීම. එතරම්ම කෝපි සඳහා ඇල්මක් නොදැක්වූ මං කෝපි ලෝලියෙක් වුණේ ඇය නිසා. ඇය වඩාත් ඇලුම්කළේ මොකා නම් කෝපි වර්ගය වුණත් මගේ හිත ඇදිලා ගියේ කැපුචිනෝ වලට. අපි කෝපිහල් ඇතුලෙදි රන්ඩුත් වෙලා තියෙනවා ඇණවුම භාර දෙන්න යද්දි.ඇයට උවමනා කළා ඇය කැමති කෝපි වර්ගයට මමත් ප්‍රිය කරනවා දකින්න.නමුත් ඒක මට කාලයත් එක්ක අසහනකාරී බවක් ඇතිකළා.

මුලින්ම ඉසබෙලාව දැක්ක දවසෙ මට ඇය කිසිදු විශේෂ හැඟීමක් ඇතිවුණේ නැහැ. ලතින් ඇමරිකානු උච්ඡාරණය නිසා ඇගේ ඉංගිරිසි කථාවේ අමුතු ලස්සනක් නොතිබුණාම නෙවේ.ඇය නිතරම උඩුකය වැසෙන්න ඇන්දෙ සුදුපාට කමිසයක්. කවදාවත් කිසිම ආභරණයක් නොපැලඳි ඉසී සිහින් කළු පැහැ රබර් වලල්ලක් නිතරම පැලඳ හිටියා.රෙදි මල්ලක් උරේ එල්ලන් විශ්ව විද්‍යාලයට පැමිණෙන ඉසී අමුතුම තේරීම් සහිත වෙනස් චරිතයක් විදියට මගේ හිත් ගත්තා.

**මතු සම්බන්ධයි**